# රුහුණ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා 2017.09.08 දින තෙක් මවිසින් අයදුම්පත් භාරගනු ලැබේ.

**01. වැඩ ඉංජිනේරු - සිවිල් (III ශ්‍රේණිය) තනතුර**

**අවශ්‍යා සුදුසුකම්:**

i. (a) සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් තිබීම.

හෝ

(b) තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු විද්‍යාව) හෝ ඊට සමාන සුදුසුකම් සහිතව පිළිගත් ආයතනයක සිවිල් ඉංජිනේරු වැඩ පිළිබඳව අවුරුදු 07 ක (හතක) පළපුරුද්දක් තිබීම.

**සටහන:** ප්‍රායෝගික පුහුණු වීමේ කාලය පළපුරුද්ද සඳහා ගණන් ගනු නොලැබේ.

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.49,860 - 3x1125 - 53,235 (EB) 54,475 - 12x1240 - 69,355 [U EX 1(II) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2017 වර්ෂය සඳහා රු.33,556 - 3x801 - 37,959.00 (EB) 38,842 - 12x883 - 49,438 [U EX 1(II) ] වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**02. <u>හෙද නිලධාරී (II ශ්‍රේණිය) තනතුර (කාන්තා)</u>**

**අවශ්‍යා සුදුසුකම්:**

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 03 කට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

ii. ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලය මඟින් පිළිගනු ලබන හෙදි යෝග්‍යතා සහතිකයක් තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.31,625 - 7x300; 10x355 - 37,275.00 [U MT 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2017 වර්ෂය සඳහා රු.22,571 - 7x213; 10x253 - 26,592.00 වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**03. <u>විදුලි කාර්මික (II ශ්‍රේණිය)</u>**

**අවශ්‍යා සුදුසුකම්:**

i. 8 ශ්‍රේණිය සමත් වී තිබීම.

ii. පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම

(අ) දෝෂයන් සොයා ගැනීම, ඒවා අළුත්වැඩියා කිරීම හා එකලස් කිරීම, පරිණාමක (ට්‍රාන්ස්ෆෝමර්) සහ සියළුම වර්ගවල යන්ත්‍රසූත්‍ර හා උපකරණ, කේබල්, විදුලි රැහැන් (වයර්) හා ඒවා වර්ග කිරීම, මිණුම් උපකරණ හා ඒවායේ භාවිතය, විදුලි රැහැන් ඇදීමේ විවිධ ක්‍රම, බද්ධ කිරීම, මනු (මීටර්) සහ කුඩා පරිණාමක පරීක්ෂා කිරීම.

(ආ) රූප සටහන් ඇඳීම හා කියවා තේරුම් ගැනීම, පරිණාමයන් කියවීම සහ භාගවලින් මාන සටහන් තැබීම.

(ඇ) මෙම වෘත්තියේදී භාවිතා වන ආයුධවල ආරක්ෂාව සහ ඒවා පාවිච්චි කිරීම පිළිබඳ දැනුමක් තිබිය යුතුය.

iii. රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක විදුලි කාර්මිකයෙකු වශයෙන් වසර දෙකකට (02) නොඅඩු පළපුරුද්දක් තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.29,915 - 16×270 - 34,235.00 [ U PL 3(III) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2017 වර්ෂය සඳහා රු.21,356 - 16×192 - 24,428.00 වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 04. කාර්මික (Mechanic) (II ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

i. 8 ශ්‍රේණිය සමත් වීම.

ii. (අ) පරිමාණ, සූක්ෂ්ම මාන කියවීම සහ භාගවලින් මාන සටහන් තැබීම

(ආ) වාෂ්ප, මෝටර් සහ ඩීසල් පිරියත හා යන්ත්‍රෝපකරණවල විශේෂිත සවි කිරීම් වර්ග, ලියවන පට්ටල් හෝ මිල්ලම් කිරීමේ යන්ත්‍ර සහ හැඩ ගැමේ යන්ත්‍ර වැනි වැඩපල යන්ත්‍ර ක්‍රියා කරවීම.

(ඇ) ඇඳීම් කියවීම් සහ අවබෝධය පිළිබඳ දැනුමක් තිබිය යුතුය.

iii. කාර්මිකයෙකු හෝ යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.29,915 - 16×270 - 34,235.00 [ U PL 3(III) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2017 වර්ෂය සඳහා රු.21,356 - 16×192 - 24,428.00 වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 05. වෙල්ඩිම්කරු (Welder) (II ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

i. 8 ශ්‍රේණිය සමත් වීම.

ii. පහත දැක්වෙන ක්‍රියාකාරකම් ගැන මනා දැනීමක් ලබා තිබීම.

(අ) පරිමාණ කියවීමේ හැකියාව. අඟලෙන් 1/32" වනතෙක් සරළ යාන්ත්‍රික ඉංජිනේරු ඇඳීමක් කියවීමට සහ තේරුම් ගැනීමට ඇති හැකියාව, වෙල්ඩිම් කිරීමේදී අවශ්‍ය වන විවිධ කාර්යයන් සූදානම් කිරීමේ ක්‍රම ගැන ඇති හැකියාව, හේත්තු, අත්වැසුම්, පරිවුම්, මුලු සහ අනෙකුත් වෙල්ඩිම් සඳහා සූදානම් වීම සහ කිරීමේ හැකියාව.

(ආ) විවිධ හරස්කඩ සහ ලෝහ වර්ග සඳහා භාවිතා කරන ඉලෙක්ට්‍රෝඩ සහ ඒවායේ විවිධ ප්‍රමාණ හා අවශ්‍ය වන ධාරාව ගැන දැන සිටීම. තිරස්, සිරස් සහ උඩින් වෙල්ඩිම් කිරීමේ හැකියාව.

(ඇ) වායු වෙල්ඩිම්කදී හෝ කැබලි ක්ලිප් හොඳ නිමාවක් ලැබෙන සේ පුරවා ගැනීමේ හැකියාව. ඇසිටලීන් පිරියතයක හෝ වායු සිලින්ඩරයක සුළු වරදක් ඇති විට එය සොයාගෙන නිවැරදි කිරීමේ හැකියාව.

iii. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක වෙල්ඩ්මකරුවෙකු ලෙස වසර දෙකකට වැඩි පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.29,915 - 16×270 - 34,235.00 [ U PL 3(III) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2017 වර්ෂය සඳහා රු.21,356 - 16×192 - 24,428.00 වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**අනෙකුත් ප්‍රතිලාභ:**
විශ්වවිද්‍යාල සේවකයින් සිය මාසික වැටුපෙන් 10% කින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතු වේ. විශ්වවිද්‍යාලය ද පෙරලා වැටුපෙන් 15% කට (8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප සඳහා ද, 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ද බැර කෙරේ.) සමාන මුදලක් දායක කරන අතර, තවත් 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා බැර කෙරේ.

අයදුම්කරුගේ ලිපිනය ලියන ලද මුද්දර ගැසූ සෙ.මී. 22×10 ප්‍රමාණයේ ලියුම් කවරයක් මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත එවීමෙන් හෝ ආයතන අනධ්‍යයන අංශයට පැමිණ හෝ රුහුණ විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුවට පිවිස (www.ruh.ac.lk) නියමිත ආකෘති පත්‍ර ලබාගත හැකිය. 2017.09.01 දින තෙක් පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

නියමිත ආකෘති පත්‍රයේ සම්පූර්ණ කරන ලද අයදුම්පත් “ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන), රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර.” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන ලද තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම හා නියමිත දිනට පසුව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට මොනම හේතුවක් නිසා හෝ එම අයදුම්පත් නැවත සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් සිය දෙපාර්තමේන්තු/සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී

රුහුණ විශ්වවිද්‍යාලය,
වැල්ලමඩම,
මාතර.
2017.08.08